සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | I

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

යුරෝපා ඉතිහාසය I

කාලය පැය තුනයි

උපදෙස්

- ♦ මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- ♦ එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- ♦ I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා නාම/ස්ථාන 5 බැගින් දී ඇත. එයින් එකක් අනෙක් ඒවා සමග නොගැළපේ. නොගැළපෙන පිළිතුර තෝරා ඊට හිමි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. පිරනීස් 2. ඇපිනයින් 3. යූරල් 4. කොකේසස් 5. කැස්පියන් (.....)

02. 1. ඊජියන් 2. අසෝව් 3. මර්මරා 4. බොස්පරස් 5. අද්‍රියාතික් (.....)

03. 1. ඇතැන්ස් 2. කොරින්ත් 3. ඇක්‍රොපොලිස් 4. ස්පාර්ටා 5. මිලේටස් (.....)

04. 1. මැරතන් සටන 2. තර්මෝපිලේ සටන 3. සලාමීස් සටන 4. ප්ලාතේ සටන 5. වොටර්ලූ සටන (.....)

05. 1. ටෙට්සල් 2. මාටින් ලූතර් 3. ජෝන් කැල්වින් 4. උල්රිච් ස්විංග්ලි 5. ජෝන්හස් (.....)

06. 1. ට්‍රෙන්ට් 2. වියානා 3. අයිලා චැපෙල් 4. ට්‍රොපොව් 5. වෙරෝනා (.....)

07. 1. රිචලියු 2. මැසරින් 3. රොබෙස්පියර් 4. ටර්ගෝ 5. නෙකර් (.....)

08. 1. වර්ජිල් 2. වෝල්ටෙයාර් 3. රූසෝ 4. මොන්ටෙස්ක්‍යූ 5. ඇඩම්ස්මිත් (.....)

09. 1. නේපල්ස් 2. ෂ්ලේස්විග් 3. පීඩ්මොන්ට් 4. ලොම්බාඩි 5. වෙනිසිය (.....)

10. 1. නෙල්සන් 2. වෙලිංටන් 3. මරාට් 4. වෙලස්ලි 5. ටොලී (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් පද යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇතිවරහන තුළ ලියන්න.**

11. 1. ඇරිස්ටෝටල් - දේශපාලනය (Politics)
    2. වර්ජිල් - එයිනඩ් (Aeneid)
    3. ප්ලූටාර්ක් - සමකාලීන ග්‍රීක සහ රෝම පුද්ගලයන්ගේ ජීවිත (Paralal Lives of noble Greekaud Romaus)
    4. ඩාන්ටේ - ඩිමයින් කොමෙඩි (The Divine comady)
    5. ජෝන් කැල්වින් - අධ්‍යාත්මික අභ්‍යාස (Spritual Exercises) (.....)

12. 1. පෙරික්ලීස් - ග්‍රීක කලාවේ ස්වර්ණමය යුගය
2. ඔගස්ටස් සීසර් - රෝමයේ ප්‍රථම අධිරාජයා
3. මාටින් ලූතර් - ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ආරම්භය
4. පළමුවන එඩ්වඩ් - එංගලන්ත පාර්ලිමේන්තු ක්‍රමයේ ආරම්භකයා
5. ලුවී නැපෝලියන් - යුරෝපා මහාද්වීපික ක්‍රමය (.....)

13. 1. ඇංග්ලෝ සැක්සන්වරු - එංගලන්තය
2. ප්‍රෑන්ක්වරු - ගෝල් දේශය
3. විසිගොත්වරු - ස්පාඤ්ඤය
4. හන්වරු - ජර්මනිය
5. ඔස්ට්‍රොගොත්වරු - ඉතාලිය (.....)

14. 1. ඔලිවර් ක්‍රොම්වෙල් - ඉංග්‍රීසි විප්ලවය
2. මිරබෝ - ප්‍රංශ විප්ලවය
3. ජෝර්ජ් වොෂින්ටන් - ඇමරිකන් විප්ලවය
4. ලුවී පිලිප් - ග්‍රීක ස්වාධීනතා ව්‍යාපාරය
5. වී.අයි. ලෙනින් - රුසියන් විප්ලවය (.....)

15. 1. බූර්බෝන් - ප්‍රංශය
2. ඔරේන්ජ් - නෙදර්ලන්තය
3. හැප්ස්බර්ග් - ප්‍රශියාව
4. රොමනොෆ් - රුසියාව
5. සැවෝයි - ස්පාඤ්ඤය (.....)

- **අංක 16 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම/ප්‍රකාශන/දින වකවානු සමූහයක් X හා Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම/දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත්ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දැක්වෙන සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

**X** **Y**

16. 1. සියක් අවුරුදු යුද්ධය — A 14 වන ලුවී
2. තිස් අවුරුදු යුද්ධය — B 16 වන ලුවී
3. බිසොවගේ යුද්ධය — C හත්වන චාල්ස්
4. හත් අවුරුදු යුද්ධය — D 13 වන ලුවී
5. ඇමරිකානු විප්ලවය — E 15 වන ලුවී

1.CDABE 2. CDAEB 3. CDEAB 4. DCEAB 5. DCEAB (.....)

**X** **Y**

17. 1. වෙස්ට්පේලියා සාම ගිවිසුම — A රජුගේ බලය සීමා වීම හා පාර්ලිමේන්තුව ශක්තිමත් වීම.
2. යුට්රේට් ගිවිසුම — B ප්‍රංශ රෙදිපිලි වෙළඳපොල කඩා වැටීම.
3. මැග්නාකාර්ටා ගිවිසුම — C ප්‍රංශ ස්පාඤ්ඤ දස අවුරුදු යුද්ධයේ නිමාව.
4. ඊඩින් ගිවිසුම — D ග්‍රීසිය නිදහස් රාජ්‍යයක් වීම.
5. අඩ්‍රියානෝපල් ගිවිසුම — E තිස් අවුරුදු යුද්ධයේ නිමාව.

1.ECABD 2. ECADB 3. ECDAB 4. CEABD 5. CAEBD (.....)

**X** **Y**

18. 1. මිලේච්ඡ ආක්‍රමණ — A ප්‍රංශ විප්ලවයේ ආරම්භය
2. කොන්ස්තන්තිනෝපලය යටත් වීම — B පළමුවන ලෝක යුද්ධයේ ආරම්භය
3. බොස්ටන් තේ සාදය — C බටහිර රෝම අධිරාජ්‍ය බිඳ වැටීම
4. බැස්ටීලය බිඳ වැටීම — D පුනරුදය ආරම්භ වීම.
5. ඔස්ට්‍රියාවේ ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ඝාතනය — E ඇමරිකන් විප්ලවය ආරම්භ වීම.

1.CDBAD 2. CDADB 3. CDEAD 4. ECDAB 5. ADCEB (.....)

| | X | | Y |
|---|---|---|---|
| 19. | 1. පෙඩ්රික් විලියම් | A | ප්‍රංශය |
| | 2. කාසල්රී | B | රුසියාව |
| | 3. මෙටර්නික් | C | ප්‍රශියාව |
| | 4. ඇලෙක්සැන්ඩර් සාර් | D | බ්‍රිතාන්‍ය |
| | 5. චාල්ස් රැන්ඩ් | E | ඔස්ට්‍රියාව |

1.CDEAB  2. CDABE  3. CDAEB  4. CDEBA  5. ABECD  (.....)

| | X | | Y |
|---|---|---|---|
| 20. | 1. කාර්මික විප්ලවය | A | එංගලන්තයේ යුරෝපයේ නාවික බලවතා වීම. |
| | 2. තර්මිඩෝරියන් ප්‍රතික්‍රියාව | B | පැරණි රාජාණ්ඩු නැවත ස්ථාපිත කිරීම. |
| | 3. ස්පාඤ්ඤ ආමේඩාව පරාජය කිරීම | C | ලිබරල්වාදී ජාතික ව්‍යාපාර මර්දනය |
| | 4. වියානා සමථය | D | නව අධිරාජ්‍යවාදය |
| | 5. කාල්ස්බාඩ් ආඥාව | E | ජැකොබින්වරුන්ගේ භීෂණය අවසන් කිරීම. |

1.DACBA  2. DABAC  3. ACDBE  4. DEBAC  5. DEABC  (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් ආදළ මාතෘකාවට නොගැලපේ. එය තෝරා ඊට අදාල අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. කාර්මික විප්ලවය එංගලන්තයෙන් ආරම්භ වීමට බලපෑ හේතු,
    1. එංගලන්තය තුල වැඩවසම් ක්‍රමය බිඳ වැටී නිදහස් සමාජ පරිසරයක් ගොඩ නැගී තිබීම.
    2. දේශපාලන ස්ථාවරභාවය
    3. නව නිපැයුම් සඳහා අනුග්‍රහය දැක්විය හැකි ධනවතුන් සිටීම.
    4. ප්‍රබල රාජාණ්ඩු ක්‍රමයක් පැවතීම.
    5. භූගෝලීය වශයෙන් රට කුඩා දිවයිනක් වීම. (.....)

22. ඇමරිකානු විප්ලවය
    1. ජනපද වැසියන් තම මව්රටට එරෙහිව ගෙන ගිය අරගලයකි.
    2. බ්‍රිතාන්‍ය වාණිජවාදි ප්‍රතිපත්ති බෙහෙවින් ඉවහල් විය.
    3. ප්‍රංශය බ්‍රිතාන්‍යයට සහාය දැක්වීම ජනපදවාසීන්ට අවාසියක් විය.
    4. ටවුන්සෙන්ඩ් පනත විරෝධය උග්‍රවීමට හේතුවිය.
    5. බොස්ටන් තේ සාදය විප්ලවයේ ආරම්භයට මුල පිරීම. (.....)

23. ඉතාලි එක්සත් ව්‍යාපාරයේ අවස්ථා,
    1. කාබෝනාරි ව්‍යාපාරයේ හා මැසිනිගේ යෞවන ඉතාලි ව්‍යාපාරය ඉතාලි ජාතිකානුරාගය අවදි කිරීම.
    2. පීඩ්මොන්ට් රාජ්‍යය ඉතාලි එක්සත් ව්‍යාපාරයේ කේන්ද්‍රීය රාජ්‍ය වීම.
    3. කවුන්ට් කැවුර් පීඩ්මොන්ට් රාජ්‍යයේ අගමැති වීම.
    4. ගැරිබෝල්ඩ් දකුණු ඉතාලිය නිදහස් කර ගැනීම.
    5. සැඩෝවා සටනින් පසුව මෙටර්නික් වෙනීසිය ඉතාලියට පැවරීම. (.....)

24. පළමුවැනි ලෝක යුද්ධය
    1. යුරෝපා බලවතුන්ගේ නව අධිරාජ්‍යවාදය
    2. බෝල්කන් ප්‍රදේශයේ ඇති වූ තුර්කි විරෝධි නිදහස් ව්‍යාපාර
    3. ප්‍රංශය හා ස්පාඤ්ඤය අතර ඇල්සාස් සහ ලෝරේන් ප්‍රදේශ වෙනුවෙන් ඇතිවූ අර්බුධය
    4. ජර්මනිය හා ඉතාලිය නව යුරෝපා බලවතුන් ලෙස නැගී ඒම
    5. යුරෝපය තුළ නව බලකඳවුරු බිහිවී දෙපිල බෙදීම. (.....)

25. ජාතින්ගේ සංගමය
    1. ලෝක සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමේ අරමුණින් පළමු වන ලෝක යුද්ධයට පසු බිහි කරගැනීම.
    2. ඇමරිකානු ජනාධිපති වුඩ්රෝ විල්සන්ගේ සංකල්පයක් මූලික වීම.
    3. ජාත්‍යන්තර ගැටුම් නිරාකරණයට මැදිහත් වීම.
    4. ඇමරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ බලවතා වීම.
    5. ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී ඇති වූ ගැටලු හේතුවෙන් වසර 20 කට පසුව ක්‍රමයෙන් බල රහිත වීම. (.....)

- **අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ABC හා D යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,**

A සහ B පමණක් නිවැරදිනම් 1 ද,
A සහ C පමණක් නිවැරදි නම් 2 ද,
B සහ C පමණක් නිවැරදි නම් 3 ද,
C සහ D පමණක් නිවැරදිනම් 4 ද,
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද වරහන තුළ ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | A සහ C පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | Cහා D පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය |

26. දේශගවේෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේද?
(A) ක්‍රි.ව. 1453 දී කොන්ස්තන්තිනෝපල් වරාය නගරය තුර්කි මුස්ලිම්වරුන් යටත් කර ගැනීම ආසන්න හේතුව විය.
(B) විද්‍යාවේ ප්‍රබෝධය සහ ජාතික රාජ්‍ය පාලකයන්ගේ අනුග්‍රහය ප්‍රධාන සාධක වීම.
(C) කාර්මික විප්ලවය තුළින් නව තාක්‍ෂණය සොයා ගැනීම.
(D) යුරෝපයේ වර්ධනය වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය (.....)

27. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේද?
(A) 1215 මහා ප්‍රඥාප්තිය පාර්ලිමේන්තු බල වර්ධනයේ ප්‍රධාන අවස්ථාවක් වීම.
(B) පළමු වන එඩ්වඩ් රජුගේ කාලයේ දී ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව බිහිවීම.
(C) 1628 අයිතිවාසිකම් පනත තුළින් පාර්ලිමේන්තුවට මූල්‍ය බලතල හිමි වීම.
(D) 1688 උත්කෘෂ්ට විප්ලවය තුළින් අගමැති ධූරය නිර්මාණය වීම. (....)

28. ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් කවර ප්‍රකාශ / ප්‍රකාශනය **නිවැරදි** වේද?
(A) ව්‍යවසම්වාදය ඉතා ප්‍රබලව පැවතීම හේතුකොට ගෙන ගොවීන් බහුතරය ඉඩම් අහිමි පුද්ගලයින් වීම.
(B) 14 වන ලුවී රජුගේ පාලන සමයේ සිට ප්‍රංශය තුළ උග්‍ර මූල්‍ය අර්බුධයක් පැවතීම.
(C) මධ්‍යම පන්තිය දේශපාලනික වශයෙන් ප්‍රංශ සමාජය තුළ ගොඩනගා ගෙන තිබූ ශක්තිමත් ජන පදනම
(D) ඔස්ට්‍රියාව සමඟ ඇති කරගෙන තිබූ ද්වීපාර්ශ්වික වෙළඳ සබඳතා නිසා ප්‍රංශ ආර්ථිකයට බාධා ඇතිවීම. (.....)

29. බෝල්ෂෙවික් විප්ලවය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේද?
(A) ඒකාධිපති සාර් පාලනයට එරෙහිව බුද්ධිමතුන් විසින් ආරම්භ කළ සමාජ ප්‍රතිසංස්කරණය ව්‍යාපාරය ශක්තිමත් ජන බලවේගයක් බවට පත්වීම.
(B) මෙන්ෂෙවික් ප්‍රතිසංස්කරණය වැඩ පිළිවෙලට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදී වැඩ පිළිවෙලක් සඳහා විප්ලවය ආරම්භ වීම.
(C) ලොව ප්‍රථම සමාජවාදී රාජ්‍ය බිහිවීම.
(D) 1917 මාර්තු විප්ලවයට පසුව රුසියාවේ යුද හමුදාව රතු හමුදාව බවට පත්වීම. (.....)

30. දෙවන ලෝක යුද්ධයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් කවර ප්‍රකාශය / ප්‍රකාශ **නිවැරදි** වේද?
(A) යුද්ධයෙන් හානියට පත් රටවල් නගා සිටුවීම සඳහා ඇමරිකාව විසින් මාර්ෂල් සැලැස්ම ඉදිරිපත් කිරීම.
(B) යුද්ධයට වගකිව යුතු රට ලෙස ජර්මනියට විශාල වන්දියක් ගෙවන ලෙස නියම කිරීම හා දඬුවම් පැමිණ වීම.
(C) එතෙක් පෙරදිග යටත් විජිත අධිරාජ්‍ය පිහිටුවා ගෙන සිටි බ්‍රිතාන්‍ය හා ප්‍රංශයට යටත් විජිත අහිමි වීම.
(D) රුසියාව හා ඇමරිකාව සමාජවාදය හා ධනවාදය මුල්කර ගනිමින් ජාත්‍යන්තර දේශපාලනයට බලපෑම් කළහැකි බලවතුන් වීම. (.....)

- **ප්‍රශ්න අංක 31 - 36 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියෙන් ඇති වරහන තුළ ලියන්න.**

31. සූර්ය කේන්ද්‍රීය මතය ඉදිරිපත් කළ විද්‍යාඥයා කවුද?
 1. ගැලීලියෝ ගැලීලි 2. නිකලස් කොපර්නිකස් 3. ජොහැන්නස් කෙප්ලර්
 4. අයිසෙක් නිවුටන් 5. ඩාන්ටේ (.....)

32. යුරෝපයේ පළමුව බිහි වූ ජාතික රාජ්‍ය කුමක්ද?
 1. එංගලන්තය 2. ප්‍රංශය 3. ස්පාඤ්ඤය 4. පෘතුගාලය 5. ඉතාලිය (.....)

33. ඉතාලිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ දී 'ගොං මොළයක් හා රත්තරං හදවතක් ඇත්තා' ලෙස ප්‍රකට වූ සටන් කවි නායකයා කවුද?
 1. මැසිනි 2. රිචලියු 3. ගැරිබෝල්ඩි 4. චාල්ස්ඇල්බට් 5. කවුන්ට් කැවුවර් (.....)

34. බ්‍රිතාන්‍යයේ කැබිනට් ක්‍රමය ආරම්භ වීමෙන් පසුව ප්‍රථම අගමැති ලෙස ක්‍රියාකළ මහජන නියෝජිතයා කවුද?
 1. ස්ටැන්ලි බොල්ඩ්වින් 2. විලියම් පිට් 3. ක්ලෙමන්ට් ඇට්ලි
 4. ජෝර්ජ් ග්‍රෙන්විල් 5. රොබට් වොල්පෝල් (.....)

35. පහත සඳහන් රටවල් අතරින් නේටෝ සංවිධානයට අයත් රට කුමක්ද?
 1. චීනය 2. උතුරු කොරියාව 3. රුසියාව 4. ස්විට්සර්ලන්තය 5. පෘතුගාලය (.....)

- **අංක 36 සිට 40 දක්වා තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1, 2, 3, 4 හා 5 වන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 36. සංවිධානාත්මක ආගමක් නොතිබු රෝම අධිරාජ්‍ය තුළ කිතුනු ආගම ව්‍යාප්ත කිරීම විශාල අභියෝගයක් වුයේ සම්ප්‍රදායික පූජකවරුන්ගේ ආධිපත්‍ය ප්‍රබල වූ බැවිනි. | මුලදී රෝම අධිරජ්‍යවරු ක්‍රිස්තියානි ආගමට විරුද්ධ වූවත් කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යාගේ පාලන සමයේ දී නීත්‍යානුකුලභාවය ලැබුණු අතර තියඩෝසියස් අධිරාජයාගේ කාලයේ කිතුනු ආගම රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බට පත්විය. (.....) |
| 37. ක්‍රි.ව. 1453 දී කොන්ස්තන්තිනෝපලය ඔටෝමන් තුර්කිවරු විසින් යටත් කර ගැනීමෙන් පසුව යුරෝපා ජාතීන්ට පෙරදිග වෙළඳාම අහිමි විය. | ඉතාලිය මුල් කරගෙන පුනරුදය ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතුන් වූයේ වැඩවසම් ක්‍රමය පිරිහීම, වෙළදාමේ දියුණුව හා ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල ශේෂයන් පැවතීමය. (.....) |
| 38. ආගමික නිදහස ගරු කරන පුද්ගලයෙකු වශයෙන් හතරවෙනි හෙන්රි රජු හියුගනෝවරුන්ට ආගමික නිදහස ලබාදුන්නේය. | ඔග්ස්බර්ග් සාම සමථය මගින් පාලකයගේ ආගම පාලිතයාගේ ද ආගම විය යුතු යැයි යන්න ප්‍රතික්ෂේප කර කතෝලික ආගමේ ඒකාධිකාරිය ආරක්ෂා කළේ ය. (.....) |
| 39. ලෙත්‍රේ දී කැචේ වරෙන්තු ක්‍රමය මගින් ඔස්ට්‍රියාවේ ලිබරල්වාදීන් මර්දනය කිරීමට මෙටර්නික් චාන්සලර්වරයා ක්‍රියා කළේ ය. | ප්‍රංශ විප්ලවය හා නැපෝලියානු යුද්ධ නිසා අවුල් වී තිබූ යුරෝපා සිතියම නැවත සකස් කිරීම හා ප්‍රංශ විප්ලවීය අදහස් යුරෝපයේ සෙසු රටවලට පැතිර යෑම වැළැක්වීම වියානා සම්මේලනකරුවන් මුහුණ දුන් ප්‍රධානම ගැටලු විය. (.....) |
| 40. හින්ඩන්බර්ග් මරණයට පත් වීමෙන් පසු හිට්ලර් ජර්මනියේ චාන්සලර් තනතුරට පත්වීම ජර්මනිය තුළ ෆැසිස්ට්වාදය වර්ධනය වීමට බලපෑ ප්‍රධානම හේතුව විය. | දෙවන ලෝක යුද්ධයෙන් ජර්මනිය පරාජය වීමෙන් පසුව ජර්මනිය බටහිර හා නැගෙනහිර වශයෙන් දෙකඩ කර බටහිර ජර්මනිය, රුසියාව විසින් හා නැගෙනහිර ජර්මනිය ඇමරිකා එක්සත් ජනපදනය විසින් පාලනය කරනු ලැබීය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## Provincial Department of Education - NWP

| 25B | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# යුරෝපා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

- **A කොටස අනිවාර්ය වේ.**
- **B කොටසින් හා C කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| 1. ටාගුස් ගඟ | 2. පිරනිස් කඳුවැටිය | 3. බොස්පරස් සමුද්‍ර සන්ධිය | 4. කළු මුහුද |
| 5. ක්‍රිමියාව | 6. ලන්ඩන් | 7. කෝර්සිකාව | 8. කීල් ඇල |
| 9. ඕස්ට්‍රියාව | 10. බෙල්ජියම | 11. ශාන්ත පීටස්බර්ග් | 12. බර්ලින් |

(නිවැරදිව නම් කිරීමට හා ලකුණු කිරීමට ලකුණු 1 බැගින්) (ල. 12)

## B කොටස

02. පහත දැක්වෙන ක්ෂේත්‍ර ඔස්සේ පුරාණ රෝමවරුන්ගේ කාර්ය සංසිද්ධිය විග්‍රහ කරන්න.

(i) ආණ්ඩු ක්‍රමය (ii) නීතිය (iii) ආගම (ල. 16)

03. 'ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය යුරෝපයේ ගමන් මඟ වෙනස් කළ ප්‍රධාන කඩ ඉමත් විය'

(i) ප්‍රොතෙස්තන්ත ව්‍යාපාරය පැන නැගුණේ කිනම් ආගමික නායකයාට එරෙහිවද? (ල 2)

(ii) ප්‍රොතෙසතන්ත ව්‍යාපාරය පැන නැගීමට බලපෑ හේතු පරීක්ෂා කරන්න. (ල. 7)

(iii) ප්‍රෙතෙස්තන්ත ව්‍යාපාරයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය පරීක්ෂා කරන්න. (ල. 7)

04. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය සිදු වූ ආකාරය නියෝජන ක්‍රමය, පක්ෂ ක්‍රමය හා කැබිනට් ක්‍රමයේ විකාශය ඇසුරින් පරීක්ෂා කරන්න. (ල. 16)

## C කොටස

05. පහත දැක්වෙන මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) ඉස්ලාම් ශිෂ්ටාචාරය
   (ii) ප්‍රංශය ජාතික රාජ්‍යයක් ලෙස ගොඩනැගීම.
   (iii) දේශගවේෂණ ව්‍යාපාරයේ ප්‍රතිඵල
   (iv) වෙස්ට්පේලියා සාම ගිවිසුම (ල. 8)

06. ''ජර්මනිය එක්සත් කරන ලද්දේ දේශපාලන අරගල මතින් නොව බිස්මාර්ක් ගේ ලේ සහ යකඩ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙනි'. ජර්මනිය එක්සත් කිරීමේ ප්‍රධාන අවස්ථා ඉහත ප්‍රකාශය ඇසුරින් පරීක්ෂා කරන්න.(ල. 16)

07. විසිවන සියවසේ යුරෝපය තුළ ඇති වූ දේශපාලනය අර්බුධ පළමුවන ලෝක යුද්ධයට මඟ පෑදීය'
   (i) පළමුවන ලෝක යුද්ධය ඇති වීමට බලපෑ ආසන්නම හේතුව කුමක්ද? (ල. 1)
   (ii) යුද්ධය ආසන්නයේ යුරෝපය බල කඳවුරු දෙකකට බෙදී ගිය ආකාරය පැහැදිලි කරන්න. (ල. 7)
   (iii) පළමුවන ලෝක යුද්ධයේ ප්‍රධාන අවස්ථා ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න. (ල. 8)

08. (i) රුසියානු විප්ලවය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාදක පරීක්ෂා කරන්න. (ල. 7)
   (ii) රුසියානු විප්ලපයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. (ල. 9)

09. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) නැපෝලියන්ගේ දේශීය ප්‍රතිසංස්කරණ
   (ii) ජාතීන්ගේ සංගමය
   (iii) යුරෝපා සම්මේලන ක්‍රමය
   (iv) බෝල්කන් ප්‍රශ්නය (ල. 8 x 2)

**12 / 13 යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| | |
|---|---|
| විභාග අංකය<br>சுட்டெண் | |

